# ජාතික සමුපකාර ප්‍රතිපත්තිය - කෙටුම්පත

## 1 වන කොටස

## සන්දර්භය

### (01) පූර්විකාව

01. රාජ්‍ය ප්‍රතිපත්තිය වශයෙන් ඉදිරිපත් කර ඇති ඉදිරි දැක්මෙහි අවධාරණය වූ අරමුණු කිහිපයක් වන්නේ බතබුලතින් සපිරි අගහිඟකමින් තොර ඉසුරුමත් රටක්, හරිත ලංකාවක්, තරුණයන්ගේ අපේක්ෂාවට මුල්තැන දෙන සුභවාදී රටක්, නිරෝගී සුවසම්පන්න මිනිස් කැළක් හා දේශීය දැනුමෙන් විදේශයන්ද ජයගන්න දේශීය ව්‍යවසායකයෙක් යන ප්‍රකාශනය මගින් මේ සදහා සමුපකාර සංවිධාන තුළින් දේශිය නිෂ්පාදන සුලභ කිරීමේ තිරසාර ක්‍රියාමාර්ගයකට පිවිසීම සදහන්වේ. තවද, කිරි ගොවි ගම්මාන, හරිත ගම්මාන වැනි වැඩපිළිවෙලවල් හදුන්වා දී ඇත. විශේෂයෙන් නිෂ්පාදනය අරමුණු කරගත් ගොවි සමුපකාර ක්‍රමයක් ආරම්භ කර ගොවියා මුහුණපාන අලෙවි ප්‍රශ්න, යෙදවුම් සහ උපකරණ ලබා ගැනීමට ඇති ගැටළුවලට සහන සපයන බවද සදහන් කර ඇත. ගොවි බැංකු ක්‍රමය තවදුරටත් ශක්තිමත් කර ගොවියාට අවශ්‍ය සියලු ණය ගොවි බැංකු ක්‍රමය මගින් ලබාදීමට කටයුතු කරන බවද සදහන් වේ. වෙළෙඳපළ සංවර්ධනය, නව තාක්ෂණය, දේශීය ව්‍යවසායකත්වය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ස්වයං රැකියා වර්ධනය වැනි කටයුතු පිළිබඳව විශේෂ අවධාරණයක් මෙම ඉදිරි දැක්ම තුළ ඇත.

02. දිවයින ආවරණය වන පරිදි මධ්‍යගත වූ සමුපකාර ක්‍රමය 1987 දී පළාත් සභා පිහිටුවීමෙන් පසුව විමධ්‍යගත කරන ලදුව සමුපකාර ව්‍යවසායයන් නියාමනය කිරීම සදහා බොහෝ පළාත්වල ප්‍රඥප්ති පනවන ලදී. පළාත් සභා කිහිපයක් තවම මධ්‍යගත රජයේ 1972 දී පනවන ලද සමුපකාර සමිති පනත හා අනුෂාංගික සංශෝධන පනත් අනුව ක්‍රියා කරති. ප්‍රඥප්ති වල ආකෘතීන් හා අන්තර්ගත විධිවිධාන විවිධාකාරවීම හේතු කොටගෙන එක් ජාතික ව්‍යාපාරයක සමස්තයට අනුගත නොවන ප්‍රතිපාදන ද ඇතුළත්ය. එසේම එම තත්ත්වය නිසා ජාතික අර්ථ ක්‍රමයේ සංවර්ධනය සඳහා වූ රාජ්‍ය සැලසුම්වලට ඍජු දායකත්වයක් ලබාදීමේ හැකියාව ව්‍යාකූල වී තිබේ. මෙය වර්ෂ 2000 දී පත් කරන ලද සමුපකාර ව්‍යාපාරය පිළිබඳ ජනාධිපති කොමිසම විසින් ද පැහැදිලි කර ඇති අතර ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව පෙන්වා දී ඇත.

03. මෙම කරුණු සැලකිල්ලට ගෙන සමුපකාර අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය ඒකාබද්ධ වී 2010 දී පළාත් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා කතිකාවන් පවත්වා ඇති අතර, එම ක්‍රියාවලිය 2012 දී විවිධ පාර්ශව නියෝජනය කරන නායකයන් එක්ව කරන ලද ජාතික සම්මන්ත්‍රණයේදී සමුපකාර ජාතික ප්‍රතිපත්තියක අන්තර්ගත විය යුතු මූලික කරුණු පිළිබඳ එකඟතාවයකට පැමිණෙන ලදී. එම එකඟතාවය පදනම් කරගෙන සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශ කමිටුවක් මගින් මෙම කෙටුම්පත සකස් කරන ලදී.

**(02) ජාතික සමුපකාර ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබඳ හේතු යුක්ති**

01. ජාතික අර්ථ ක්‍රමය මෙහෙයවන ප්‍රධාන ස්ථම්භ තුනෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙක සඳහා ගෝලියකරණය වූ වෙළඳපලට මුහුණදීමට හැකිවන පරිදි නීති පද්ධතීන් හා නියාමන ක්‍රම යාවත්කාලීක කර තිබේ. මෙතෙක් පනවන ලද අණපනත් සමුපකාර අංශයේ ක්‍රියාකාරිත්වය නියාමනය කරන නීති පද්ධතිය හා නියාමන ක්‍රමය, සංවෘත හා මධ්‍යගත අර්ථ ක්‍රමයකට උචිත ලෙස සිදුවේ. පළාත් සභා ප්‍රඥප්ති පදනම් කරගෙන ඇත්තේද මෙම නෛතික රාමුවයි. එමඟින් සමුපකාර ව්‍යාපාරයේ ප්‍රගමනයට බාධක එල්ල වී තිබේ.

02. තවද ජාත්‍යන්තර සමුපකාර ව්‍යාපාරය තුළ කාලෝචිත වන පරිදි නව සමුපකාර අනන්‍යතා ප්‍රකාශයක් හා ප්‍රතිපත්ති මාලාවක් 1995 දී ජාත්‍යන්තර සමුපකාර සන්ධානය විසින් සම්මත කරන ලද අතර එය ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් 2002 දී 193 නිර්දේශය මඟින් ආදේශනය කරලීමෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවලට (ශ්‍රී ලංකාව ඇතුළු) හඳුන්වා දෙන ලදී. එසේම එයට පෙර 2001 දී සමුපකාර සංවර්ධනය සඳහා සහාය වන පරිසරයක් නිර්මාණය කිරීමේ මගපෙන්වීමක් සාමාජික රටවලට ඉදිරිපත් කර ඇත. එසේ වුවද මෙම නව වැඩි දියුණු වූ මූලධර්ම ලංකාවේ සමුපකාර නීති පද්ධතියට හා සංවර්ධන ක්‍රියාවලියට අන්තර්ග්‍රහනය කර ගැනීමක් තවම සිදුව නැත.

03. මෙම පසුබිම මත ලංකාවේ සමුපකාර ව්‍යාපාරය සදහා යාවත්කාලීන වූ ජාතික සමුපකාර ප්‍රතිපත්තියත් ප්‍රකාශයට පත් කිරීම සමුපකාර සංවර්ධන ක්‍රියාවලියේ පූර්ව අවශ්‍යතාවයක්ව පවතී. එම මූලධර්ම අනුව අවශ්‍ය නෛතික හා නියාමන සංශෝධන ඇති කිරීමෙන් රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සදහා සමුපකාර ව්‍යාපාරයේ දායකත්වය සක්‍රීය ලෙස ලැබෙනු ඇත.

## 2 වන කොටස

## ජාතික සමුපකාර ප්‍රතිපත්ති ප්‍රකාශය

**(01) අරමුණ**

සමුපකාර සංවිධාන පිළිබද මෙම ජාතික ප්‍රතිපත්තියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනයට ගෝලීයකරණය වූ වෙළදපළක පසුබිම මත සක්‍රීය වූ දායකත්වයක් ලබාදීම පිණිස, ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා ලද සමුපකාර අනන්‍යතා ප්‍රකාශයට හා එම ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් ක්‍රියාකාරී වීමට අවශ්‍ය වන්නා වූ නෛතික හා නියාමන පරිසරයක් ඇති කිරීම පදනම් කර ගත් ප්‍රතිපත්තිමය ආදර්ශයක් නිර්මාණය කිරීමය.

### (02) රාජ්‍ය පෞද්ගලික හා සමුපකාර අංශවල සමෝධාන

**01. සමුපකාර ව්‍යවසායයන් සමතලයක කටයුතු කිරීම**

රාජ්‍ය හා පෞද්ගලික අංශ සමඟ සමතලයක සිට තම සක්‍රීය දායකත්වය ලබාදීමට හැකි ආර්ථික ප්‍රතිපත්ති හා නෛතික පරිසරයක් තුළ සමුපකාර අංශය ක්‍රියාත්මක වනු ඇත. එම කාර්යභාරය සමුපකාර ව්‍යවසායයෙහි අනන්‍යතාවට අනුකූලව ඉෂ්ඨ කිරීමට අවශ්‍ය පරිසරය රජය විසින් නිර්මාණය කරනු ඇත.

**02. සමුපකාර ක්ෂුද්‍ර මූල්‍ය විස්තාරණය**

සමුපකාර සංවිධානය විසින් සාමාජිකත්වය පදනම් කර ගත් මූල්‍ය ව්‍යාපාර පුළුල් ප්‍රජාවට සහභාගි විය හැකි පරිදි ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යවසායවල සිට වාණිජ බැංකු දක්වා විස්තාරණය කිරීමට කටයුතු කරන අතර, රජය විසින් ඒ පිළිබඳ නෛතික හා නියාමන ක්‍රම හදුන්වා දෙනු ඇත.

**03. ප්‍රජාවගේ මූලික භෞතික අවශ්‍යතා ඉටු කිරීමේදී සමුපකාර භූමිකාව**

සමුපකාර සංවිධාන විසින් ප්‍රජාවගේ මූලික පැවැත්ම පිළිබද අවශ්‍යතා වූ ආහාර නිෂ්පාදනය හා සැකසුම, නිවාස ඉදිකිරීම් හා නඩත්තුව, පාරිභෝගික අවශ්‍යතා ඉෂ්ඨ කිරීම සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දියත් කිරීම අවධාරණය කරමින් ජනතාවගේ ජීවන මාර්ග ඇති කිරීම කෙරෙහි ව්‍යවසායික අවධානයෙන් කටයුතු කරන අතර ඒ සදහා යටිතල හා සේවා පහසුකම් සැලසීම කෙරෙහි රජය මැදිහත් වනු ඇත.

**04. සමුපකාර ව්‍යවසායයන්හි සේවාවල අගය වර්ධන ක්‍රියාදාමය**

මෙම සංවිධාන මගින් ක්‍රියාත්මක වන විවිධ ආර්ථික කටයුතුවල පෙර පසු සම්බන්ධතා , අගය වර්ධන ක්‍රියාදාම සංවර්ධනය, හවුලේ සකස් කිරීම් හා අලෙවි ප්‍රවර්ධනය ඇති කිරීම සදහා රාජ්‍ය හා පෞද්ගලික අංශවල ව්‍යාපාරික ආයතන

සමග උපාය මාර්ගික හා ව්‍යාපාරික හවුල් ඇති කිරීමට සමුපකාර ව්‍යවසායවලට අවශ්‍ය උනන්දු කිරීම් හා දිරිගැන්වීම් ලබා දෙනු ලැබේ.

**05. සමුපකාර මගින් සාධාරණ වෙළදාම**

ශ්‍රී ලංකාවේ සමුපකාර සාමාජික පවුල්වලට මෙන්ම සමස්ත පාරිභෝගික ජනතාවට පිළිගත් වෙළද ආචාර ධර්ම මගින් සාධාරණ මිලක් හා ගුණාත්මක භාණ්ඩ ලබාදීමේ අරමුණින් සිල්ලර වෙළඳසැල්, සුපිරි වෙළඳසැල් හා තොග වෙළඳසැල් ප්‍රතිසංවිධානය කෙරෙනු ඇත.

**06. සමුපකාර ව්‍යවසාය විවිධාංගීකරණය**

සමුපකාර ව්‍යවසාය ක්‍රමය දැනට පවත්වාගෙන යන කෘෂිකර්මය, ණය හා බැංකු සේවා, පාරිභෝගික සේවා, සුළු කර්මාන්ත, රෝහල් හා සාත්තු සේවා, අවමංගල්‍ය සේවා, ධීවර හා සත්ත්ව පාලනය, පොල් නිෂ්පාදනය හා සැකසුම් වැනි ක්ෂේත්‍ර වලින් තවදුරටත් පුළුල් සේවා ලබා දෙන අතර තොරතුරු තාක්ෂණය වැනි නව සේවාවන් කරා විවිධාංගීකරණය කිරීමට පහසුකම් සලස්වනු ඇත.

## (03). සමුපකාර ව්‍යවසායයන්හි කළමනාකරණ සංවර්ධන හා යහපාලනය

**01. සමුපකාර ස්වයං මූල්‍ය පිළිබඳ නෛතික හා කළමනාකරණ ක්‍රියාමාර්ග**

සමුපකාර ව්‍යවසායයන් ස්වයං මූල්‍යයකින් හා ලාභදායකත්වයකින් පවත්වාගෙන යාමට අවශ්‍ය නියාමන හා කළමනාකරණ ක්‍රම හඳුන්වා දීමට රජය විසින් ක්‍රියා කරනු ඇත. මෙම ක්‍රියාවලියට නෛතික සංශෝධන හා නියාමන විධි විධාන ඇතුලත් විය යුතුය.

**02. සමුපකාර සංවිධාන වල යහපාලනය තහවුරු කිරීම**

සමුපකාර සාමාජිකයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ස්ථාපිත කෙරෙන පරිදි සංස්ථාමය යහපාලනය ක්‍රමයක් හඳුන්වා දීමටද අධ්‍යක්ෂවරුන් හා කළමනාකරුවන්ගේ වගවීම් හා වගකීම් පිළිබඳ දණ්ඩනයන් රැගත් නියාමනයක් හඳුන්වා දීමටද ක්‍රියාකරනු ලැබේ.

**03. වැඩිදියුණු කළ කළමනාකරණ තොරතුරු පද්ධතිය හා ගිණුම්කරණය**

වැඩි දියුණු කළ කළමනාකරණ තොරතුරු පද්ධතියක් හා යාවත්කාලීන වූ ද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත වලට අනුකූල වූවද ගිණුම් ක්‍රමයක් රැගත් කළමනාකරණ මෙහෙයුම් ක්‍රියාවලියක් හඳුන්වා දීමට විධිවිධාන සලස්වනු ඇත.

**04. සමුපකාර සේවක රැකියා සංවර්ධනය**

සමුපකාර කාර්ය මණ්ඩල සඳහා සකස් කරන ලද රැකියා සංවර්ධන ක්‍රමයක් මගින් කාර්ය මණ්ඩලවල වෘත්තීමය කුසලතා සංවර්ධනයක් ඇති කිරීමට ක්‍රියා කරනු ලැබේ.

### 05. සමුපකාර සාමාජිකයින් සක්‍රීය ලෙස සහභාගී කරවා ගැනීම

සමුපකාර සංවිධාන වල සාමාජිකයින් සක්‍රීය ලෙස ව්‍යාපාරික කටයුතු හා පාලන කටයුතුවලට සහභාගී විය යුතුය. ඒ සදහා ඔවුන්ගේ ප්‍රාග්ධන සැපයුම හා ගණුදෙනු වර්ධනය කිරීමේ උපාය මාර්ග සමග අවබෝධය ලබාදීමේ ක්‍රියාවලියක් පිළිබඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනු ලැබේ.

### 06. සමුපකාර ව්‍යවසායයන්හි පරිසරය හා කාන්තා සහභාගිත්වය

පරිසර සංරක්ෂණය හා කාන්තාවන්ට සම අවස්ථා ලබා දීම සමුපකාර ව්‍යවසාය වල පොදු අවශ්‍යතා හා ප්‍රතිපත්ති ලෙස සලකනු ලැබේ.

## 04. සමුපකාර සංවිධාන වල ස්වයං ප්‍රාග්ධන සම්පාදනය

### 01. සමුපකාර සංවිධාන වල ස්වයං ප්‍රාග්ධන සම්පාදනය

සමුපකාර සංවිධාන අවශ්‍යයෙන්ම ස්වයං ප්‍රාග්ධනයෙන්ම තම ව්‍යාපාර කටයුතු කරන ව්‍යවසායයන් ලෙස සලකනු ලැබේ. එම සංවිධාන වල ව්‍යාපාර කටයුතුවලට සාපේක්ෂ වූ කාරක ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීමට අවශ්‍ය උපාය මාර්ග සකසා ගැනීමට මගපෙන්වීම හඳුන්වා දෙනු ඇත.

### 02. ස්වයං ප්‍රාග්ධන සැපයුම් මාර්ග

සමුපකාර සංවිධාන වල ස්වයං ප්‍රාග්ධන ඒකරාශී කිරීම පිණිස අභ්‍යන්තර අතිරික්ත ප්‍රතියෝජනය හා ණය කළමනාකරණය විධිමත් කෙරෙනු ඇත.

### 03. සමුපකාර වල දායකත්වයෙන් සෑදු පොදු අරමුදල්

සමුපකාර සමිති/සංගම් වල දායකත්වයෙන් ස්ථාපිත වූ සමුපකාර සංවර්ධන අරමුදල, අතිරික්ත අරමුදල වැනි පොදු අරමුදල් පිළිබඳ කළමනාකරණය කාර්යක්ෂම කිරීම තුළින් සමුපකාර ව්‍යවසාය වලට අවශ්‍ය කාරක ප්‍රාග්ධනයට දායකවීමට විධිවිධාන සලස්වනු ලැබේ.

### 04. සමුපකාර සංවිධාන වල අතිරික්ත මුදලින් බැංකු ක්‍රමයක්

සමුපකාර ව්‍යාපාරය තුළ ඒකරාශී වන අතිරික්ත අරමුදල් ප්‍රති ආයෝජනය වන පරිදි ඇති කරන මූල්‍ය ක්‍රමයක් තුළින් සමුපකාර වාණිජ බැංකුවක් ස්ථාපිත කිරීම සඳහා වූ නෛතික පරිසරය සකස් කෙරෙනු ඇත.

## 05. සමුපකාර නීතිය ප්‍රතිශෝධනය කිරීම

### 01. ශ්‍රී ලංකාවේ වර්තමාන අර්ථ ක්‍රමයට ගැලපෙන සමුපකාර නීති සම්පාදනය

1970 දශකයේ පැවතුණු දේශපාලන හා ආර්ථික පරිසරය පදනම් කරගෙන හඳුන්වා දෙන ලදුව දැනටද ක්‍රියාත්මක වන සමුපකාර නීතිය වර්තමාන විවෘත වෙළඳපළ ආර්ථික පරිසරයට ගැලපෙන පරිදි සහ වෙනස් වූ සමුපකාර අනන්‍යතාවට අනුකූල වන පරිදි නැවත සකස් කර ක්‍රියාත්මක කරනු ඇත.

### 02. ව්‍යාජ සමුපකාර සංවිධාන බිහිවීම වැළැක්වීම

ව්‍යාජ සමුපකාර සංවිධාන ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම වැළැක්වීමේ නෛතික හා නියාමන විධිවිධාන රජය විසින් හඳුන්වා දෙනු ලැබේ.

### 03. නව සමුපකාර නීතියට ගැළපෙන ආදර්ශ අතුරු ව්‍යවස්ථා

නව සමුපකාර නීතිය හා යහපාලනයට අනුකූල වන පරිදි සමුපකාර සංවිධාන වල අතුරු ව්‍යවස්ථා සම්පාදනය වැදගත්වන බව රජය සලකන අතර ඒ සඳහා අවශ්‍ය සහාය ලබා දෙනු ඇත.

### 04. පවතින සමුපකාර සේවක නීතිය ප්‍රතිශෝධනය කිරීම

දැනට භාවිතයේ පවතින සමුපකාර සේවක නීති හා රීතිවල සංශෝධන අවශ්‍යය. ඒවා පොදුවේ පිළිගත් කම්කරු ප්‍රඥප්ති හා ප්‍රතිපත්ති අනුව යාවත්කාලීන කිරීම යෝග්‍ය බව නිර්ණය කරන අතර ඒවායේ වෙනස්කම් ඇති කරනු ඇත.

## (06) සමුපකාර සංවිධාන වල සිරසාකාර හා තිරසාකාර අන්තර්ග්‍රහණය

### 01. සමුපකාර ව්‍යපාරය ඒකීය ව්‍යාපාරයක් ලෙස සැලකීම

සමුකාර ව්‍යාපාරය දිවයින පුරා විසිරී ඇති ඒකීය ව්‍යාපාරයක් බව රජය පිළිගනී. එම විෂය පළාත් සභා වලට විමධ්‍යගත වීමේදී විවිධ පළාත් සභා වල ඇති වූ එකිනෙක නොගැලපෙන වෙනස්කම් නිසා ඇති වූ අසමතුලිතතාව මගහරවාලීම පිණිස ක්‍රමවත් හා නිරන්තර කතිකාවත් ක්‍රමයක් ස්ථාපනය කරනු ඇත.

### 02. මධ්‍යම රජය හා පළාත් සභා වල සමුපකාර නීති ඒකමිතියකට ගෙන ඒම

පළාත් සභා ප්‍රඥප්ති හා ජාතික මට්ටමේ සමුපකාර නීති පද්ධති ඒකමිතියකට ගෙන ඒම පිණිස පොදු නෛතික රාමුවේ මූලධර්ම පිළිබඳව අදාල නීතිදායකයන්ට මගපෙන්වීමක් මධ්‍යම රජය විසින් කරනු ලැබේ.

### 03. සමුපකාර සංවිධාන වල ව්‍යුහය

පළාත් සභා භූගෝලීය සීමා ඉක්ම වූ සමුපකාර සංගම් හා ජාතික මට්ටමේ මහා සංගම් සඳහා විචාරාත්මක ව්‍යුහයක් ඇති කිරීමෙන් සම්පත් වල උපරිම ඵලදායීතාවයට සහ ව්‍යාපාරික ලාභදායකත්වයට ඉඩ කඩ සැලසෙනු ඇත.

### 04. සමුපකාර සංවිධාන සඳහා පලාත් තුළ හා අන්තර් පළාත් ව්‍යාපාරික සන්ධාන

පළාත් සභා තුළ හා අන්තර් පළාත් සමුපකාර සංවිධානවලට තම ව්‍යාපාරික කටයුතු හවුලේ කරගෙන යාමට හා අවශ්‍ය ව්‍යාපාරික සංවර්ධනය සමග ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වාගෙන යන මුදුන් මට්ටමේ සමුපකාර සංවිධානයට අනුබද්ධ විමට ඉඩකඩ සලසනු ඇත.

## 07.සමුපකාර අධ්‍යාපනය, පුහුණුව හා තොරතුරු සැපයීම

### 01. සමුපකාර අධ්‍යාපනය හා පුහුණුව සඳහා තාක්ෂණික සහාය

සමුපකාර සමිතිවල සාමාජිකයන් හා සේවකයන් පුහුණු කිරීම සඳහා දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමේ විද්‍යායතන පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික උපදෙස් මධ්‍යම රජය විසින් ලබාදීමට කටයුතු කිරීම මධ්‍ය රජයේ කටයුත්තක් ලෙස සලකා විධිවිධාන සලස්වනු ලැබේ.

### 02. ශ්‍රී ලංකා ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ කාර්යභාරය

සමුපකාර කළමනාකරණ සංවර්ධනය, නියාමන නිලධාරීන්ගේ පුහුණුව හා නායකත්වය පුහුණු කිරීමේ ක්‍රමවේදයන් ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ මෙහෙයවීමෙන් හඳුන්වා දෙනු ඇත.

### 03. සමුපකාර අධ්‍යාපන හා පුහුණු කටයුතු වල සම්බන්ධීකරණය

සමුපකාර පුහුණු ආයතන හා රජයේ පුහුණු ආයතන අතර හවුල් වැඩසටහන් හා පාඨමාලා ඉදිරිපත් කිරීමට හැකි සම්බන්ධීකරණයක් විධිමත් ලෙස සංවිධානය කිරීම සමුපකාර අමාත්‍යාංශය හරහා සිදුවනු ඇත.

### 04. සමුපකාර තොරතුරු හුවමාරුව සඳහා ඒකාබද්ධ ක්‍රමයක්

සමුපකාර විෂයය විමධ්‍යගත හේතුකොට ගෙන සමුපකාර ව්‍යාපාරයේ ප්‍රගති සමාලෝචනයට අවශ්‍ය තොරතුරු ලබාගැනීමේ අපහසුකම් මගහරවාලීම පිණිස අන්තර්ග්‍රාහී තොරතුරු රැස්කරන නිශ්කාෂණය කරන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට මධ්‍යම රජයේ සහාය මුදුන් මට්ටමේ සමුපකාර මණ්ඩලයට ලබාදෙනු ලැබේ.

## 3 වන කොටස
## ක්‍රියාකාරී වැඩපිළිවෙල

### (01) .රාජ්‍යමය, පෞද්ගලික හා සමුපකාර අංශවල සමෝධානය

01. සමුපකාර ව්‍යාවසාය පිලිබඳ අවධාරණයකින් යුතුව ඒ ඒ අංශ වල අනන්‍යතා හා භාවිතයන් ගැන දැනුවත් කිරීම සඳහා සමුපකාර සාමාජිකයන් සඳහා වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීම.

02. සමුපකාර ව්‍යවසායයන් සෙසු ව්‍යාපාරික අංශ සමග සමතලයක සිට කටයුතු කිරීමට බාධක ඇතහොත් ඒවා හඳුනාගැනීම හා අවශ්‍ය ප්‍රතිපත්තිමය හා නෛතික සංශෝධන කිරීම.

03. සමුපකාර ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමය හා බැංකු සේවා පිළිබඳ විධිමත් නියාමන ක්‍රමයක් රජය විසින් හඳුන්වා දීම.

04. වෙළෙඳපළෙහි මිල ස්ථාවරත්වය හා ජීවන වියදම් අඩු කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට සක්‍රීයදායකත්වයක් ලබා දීම පිණිස විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් මගින් ක්‍රියා කිරීම.

05. පාරිභෝගික භාණ්ඩ ආනයනය, සැකසුම, තොග වෙළෙදාම හා සිල්ලර වෙළෙදාම සඳහා ගම්මට්ටමේ මිනිකෝප්සිටි වෙළෙඳසැල් වල සිට පාරිභෝගික සහා සංගම් දක්වා ඇති ව්‍යුහයේ දුර්වලතා මගහරවා ගැනීම සඳහා නිසි කළමනාකරණය හා නියාමන ක්‍රම හඳුන්වා දීම.

06. සමුපකාර කේෂ්ත්‍රය තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් පුහුණුව හා සංවර්ධනය ඇති කරමින් ඔවුන් සමුපකාර සංවිධාන වලට සංවිධානගත කිරීම.

07. අතීතයේ ප්‍රචලිත වූ කෘෂිකර්ම සමුපකාර සමිති ව්‍යාපාරයක් ඇති කිරීම සඳහාත් යොවුන් කෘෂිකාර්මිකයින්ගේ සමාජ බිහිකිරීමේ නියමු වැඩපිළිවෙලක් හඳුන්වාදීම සඳහාත් පරිසර ගොවිතැන් ක්‍රම ප්‍රචලිත කිරීම සඳහාත් විධිවිධාන සැලැස්වීම.

08. සමුපකාර නිවාස ක්‍රම සහ නඩත්තු සේවා සඳහා ලොව වෙනත් ස්ථාන වල සාර්ථක වූ සමුපකාර ක්‍රමවේදයක් හඳුන්වා දීම.

09. යොවුන් සමුපකාර ව්‍යවසායයන් ප්‍රතිසංවිධානය කර පාසල්, විශ්ව විද්‍යාල හා වෙනත් විද්‍යායතනවල සමුපකාර ව්‍යවසායකයන් ඇති කිරීම.

10. දැනට පවතින සමුපකාර සමිති ප්‍රතිසංවිධානය කර රැකියා වියුක්තයන් සඳහා ස්වයං රැකියා හඳුන්වාදීම හා සේවා සඳහා වෙළෙඳපලක් හඳුන්වාදීමට පහසුකම් සැලැස්වීම.

11. කෘෂි නිෂ්පාදන හා සත්ත්ව පාලන සමුපකාර සංවිධානවල නිෂ්පාදන සකස් කිරීම්, කර්මාන්ත, හවුල් සංවිධාන හා ව්‍යාපාර තුළින් අගය වර්ධන ක්‍රියාවලියකට යොමු කිරීම.

12. සමුපකාර නිෂ්පාදන සමිතිවල භාණ්ඩ සමුපකාර සුපිරි වෙළෙඳසැල් ජාලය හරහා විකිණීමට වැඩපිළිවෙලක් හඳුන්වා දීම.

13. යෝග්‍ය හා අවශ්‍ය අවස්ථා වල රජයේ හා පෞද්ගලික ව්‍යවසායයන් සමග හවුල් ව්‍යාපාර ආරම්භ කර නිෂ්පාදන අලෙවියට හා පාරිභෝගික භාණ්ඩ සැපයුමට ක්‍රියාකිරීම.

14. සුළු අපනයන භෝග හා සකස් කළ කෘෂි නිෂ්පාදන සමුපකාර සහා සංගම් හා අපනයන සමාගම් හරහා අපනයනයට කටයුතු කිරීම.

15. සමුපකාර රෝහල් පද්ධතිය, සාත්තු සේවා, වෛද්‍ය උපදේශන සේවා සහ අවමංගල්‍ය සේවා නවීකරණය කිරීම හා ඒවායේ ධාරිතා සංවර්ධනය.

(02) **සමුපකාර ව්‍යවසාය වල කළමනාකරණ සංවර්ධනය හා යහපාලනය**

01. සමුපකාර ව්‍යවසායයන්හි ව්‍යාපාරික උපාය මාර්ග සැලසුම් සංකල්ප හා ක්‍රමවේදයන් හඳුන්වා දීම හා ධාරිතා සංවර්ධනය.

02. සමුපකාර ව්‍යවසායයන් තුළ ක්‍රමවත් කාර්ය සාධන කළමනාකරණ පද්ධතීන් ක්‍රියාත්මක කිරීම.

03. සමුපකාර සංවිධාන වල පවතින ඵලදායිතා හීන වූ වත්කම් ලාභදායී තත්ත්වයට ගෙන ඒම හෝ විකිණීමෙන් හෝ කාරක ප්‍රාග්ධනය ඉහළ නැංවීමට ක්‍රියා කිරීම.

04. යාවත්කාලීන වූද අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුකූල වූද ගිණුම් ක්‍රමයක් හා පරිගණකගත කලමනාකරණ තොරතුරු ක්‍රමයක් හඳුන්වා දීම.

05. සමුපකාර විගණන ක්‍රමය යාවත්කාලීන කිරීම හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කිරීම.

06. රජය පිළිගත් පෞද්ගලික සමාගම් සඳහා වූ සංස්ථාමය යහපාලන චර්යාධර්ම සංග්‍රහයට සමාන ක්‍රමයක් සමුපකාර අංශය සඳහා නියාමනයක් ලෙස හඳුන්වා දීම.

07. සමුපකාර සංවිධාන වල තීරණ ගැනීම් වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස කිරීම සඳහා කමිටු හා උපදේශක මණ්ඩල ක්‍රමයක් ව්‍යවස්ථාපිතව ක්‍රියාත්මක කිරීම.

08. සමුපකාර සංවිධානවල ව්‍යාපාර කටයුතු සඳහා යහ භාවිතා සංග්‍රහයක් සකස් කර එම ආදර්ශය යටතේ ව්‍යාපාරික කටයුතු කිරීමට විධිවිධාන යෙදීම.

09. සමුපකාර සමිති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා සුදුසුකම්. වත්කම් ප්‍රකාශ හා හෙළිදරව් කිරීම් නියම කරන ප්‍රතිපාදන රැගත් චර්යා ධර්ම පද්ධතියක් හඳුන්වා දීම.

**(03) සමුපකාර සංවිධානවල ස්වයං ප්‍රාග්ධන සම්පාදනය**

01. සමුපකාර සංවිධානවල ප්‍රාග්ධන සම්පාදනය ස්වෙච්ඡාවෙන් ඉහළ නැංවීමට මුදල් සපයන වැඩි අවධානමක් දරණ සාමාජිකයන් තීරණ ගැනීම් සඳහා සක්‍රීයව සහභාගී කිරීමේ ක්‍රමෝපාය හඳුන්වාදීම.

02. සමුපකාර ව්‍යවසායවල ස්වරූපය අනුව අවශ්‍ය මූලික ප්‍රාග්ධනය ලබාගැනීම පිණිස කොටසක අගය ප්‍රතිශෝධනය කිරීමට සැලැස්වීම.

03. පාරිභෝගික අණකර, තැන්පත්. බැඳුම්කර හා වෙනත් ක්‍රම මගින් සාමාජිකයන්ගෙන් අතිරේක ප්‍රාග්ධන සම්පාදනය.

04. සමුපකාර ප්‍රාථමික සමිති සාමාජිකත්වය දරණ ග්‍රාමීය බැංකු සංගම් හා මහා සංගම් ජාලය හරහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබා ගැනීමට හා සාධනීය වූ ව්‍යවසායවල ආයෝජනය කිරීමට පහසුකම් සැලසීම.

05. සමුපකාර සංවිධානවල විවිධ ව්‍යාපාර ඒකක සඳහා ලාභ කේන්ද්‍ර ක්‍රමය හඳුන්වාදීම.

06. සමුපකාර සංවිධාන සතුව අතිරික්ත අරමුදල්, සමුපකාර සංගම් හා හවුල් ව්‍යාපාර හරහා සාමාජිකයන්ගේ නිෂ්පාදන අගය වර්ධන ක්‍රියාදාමයකට යෙදවෙන පරිදි ආයෝජනය කිරීමෙන් වැඩි ප්‍රතිලාභ ලබාගැනීමේ ක්‍රමයක් සකස් කිරීම.

07. සමුපකාර බැංකු ක්‍රමය තුළ ණය කළමනාකරණය කාර්යක්ෂම කිරීමේ නව ක්‍රමෝපායයන් හඳුන්වාදීම.

08. සමුපකාර සංවිධාන වලින් ලබාගන්නා දායකත්වයෙන් ස්ථාපිත කරන ලද සමුපකාර අරමුදල් සමුපකාර නියෝජිතයන්ගේ සක්‍රීය කළමනාකරණ සහභාගිත්වයෙන් සමිති අවශ්‍යතා සඳහා චක්‍රීය ලෙස ආයෝජනය කිරීම.

09. සමුපකාර සංවිධාන කොටස්කරුවන් වන පරිදි වාණිජ බැංකුවක් පිහිටුවීමට අවශ්‍ය නෛතික ඉඩකඩ හා පහසුකම් සැලැස්වීම.

10. සමුපකාර සංවිධානවල අතිරික්ත අරමුදල් වැඩි ඵලදායිතාවයක් ඇතිවන පරිදි අවධානම අඩු හා ප්‍රතිලාභ වැඩි මූල්‍ය හා ව්‍යාපාරික ආයතනවල (කොටස් වෙළඳපල ඇතුළුව) ආයෝජනය කිරීම සඳහා නෛතික ඉඩකඩ නියාමනයන් හා උපදේශ සේවා සැලැස්වීම.

**(04) සමුපකාර නීතිය සංශෝධනය කිරීම**

01. විවෘත වෙළඳපල ආර්ථිකයක සමුපකාර ව්‍යවසායයන් සාධනීය(තිරසාර) හා සංවර්ධනයට පාත්‍ර වූ ජාත්‍යන්තර ආදර්ශ පදනම් කර ගත් හා ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලවන පරිදි නව සමුපකාර නීතියක් ස්ථාපනය කිරීම.

02. සමුපකාර නීතිය හා නියාමනයන් ක්‍රියාත්මක කිරීමට පහසුවන පරිදි මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රතිව්‍යුහගත කිරීම.

03. පවතින සමුපකාර සේවක නීතිය සමාලෝචනය කිරීම හා ඉන් පසුව ජාත්‍යන්තර හා දේශීය වශයෙන් පිළිගත් කම්කරු ප්‍රඥප්ති හා එකඟතාවයන්ට අනුකූලව මධ්‍යම රජයේ ආදර්ශ නීතියක් සම්පාදනය කිරීම හා පළාත් සභා මඟින් එය ආදේශනය කිරීමට කටයුතු කිරීම.

04. සමුපකාර ව්‍යවසායයන් හා සංවිධාන ලියාපදිංචි කිරීමේදී හා පවත්වාගෙන යාමේදී ඇතිවන අනන්‍යතාවය පිළිබඳ ආරවුල් විසඳීම සඳහා ව්‍යවස්ථාපිත මණ්ඩලයක් පිහිටුවීම තුළින් ව්‍යාජ සමුපකාර සංවිධාන බිහිවීම වැළැක්වීම.

05. සකස් කෙරෙන නව සමුපකාර නීතිවලට අනුකූලවූ ආදර්ශ අතුරු ව්‍යවස්ථා, විවිධ ව්‍යවසායික ක්ෂේත්‍රවලට ගලපා ගතහැකි පරිදි සම්පාදනය කිරීම.

06. සමුපකාර ආරවුල් සම්බන්ධයෙන් ඇති අභියාචනා විසඳීම පිණිස ස්වාධීන ආරවුල් මණ්ඩල පත් කිරීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සැලසීම.

(05). **සමුපකාර සංවිධානවල සිරසාකාර හා තිරසාකාර අන්තර්ග්‍රහණය**

01. අන්තර් පළාත් හා මධ්‍යම රජයේ අමාත්‍යාංශවල සම්බන්ධීකරණය සඳහා සමුපකාර අමාත්‍ය සමුළුවක් විධිමත් ලෙස පිහිටුවීම.

02. ජාතික සමුපකාර ප්‍රතිපත්තිය අනුව, මධ්‍යම රජයේ සමුපකාර නීතිය හා පළාත් සභාවල සමුපකාර ප්‍රඥප්ති සඳහා පොදු ආදර්ශයක් සකස් කිරීමට කටයුතු කිරීම.

03. සමුපකාර ව්‍යවසායයන් සඳහා පළාත් හා අන්තර් පළාත් මට්ටමේ ව්‍යාපාරික හවුල් හා අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

04. සමුපකාර සාමාජිකයන්ගේ සමුපකාර ව්‍යවසායකත්වය පිළිබඳ සංවර්ධන වැඩසටහන් හා ඔවුන්ගේ සංවිධානවල ක්‍රියාකාරිත්වය පිළිබඳ පුහුණු වැඩපිළිවෙළ දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා ප්‍රාථමික සමුපකාර සමිති හරහා ක්‍රියාත්මක කිරීම.

05. සමුපකාර සමිතිවල ධාරිතා සංවර්ධනය හා පුහුණු ව්‍යාපෘති පිළිබඳව ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය හා මුදුන් මට්ටමේ සමුපකාර සංගම් මගින් කටයුතු කිරීම.

06. සමුපකාර පුහුණු ආයතන අතර විධිමත් සම්බන්ධීකරණයක් ඇති කිරීම පිණිස මධ්‍යම රජය හරහා යාන්ත්‍රණයක් ඇති කිරීම.

07. පාසැල් සමුපකාර ප්‍රතිසංවිධානය කිරීම හා පාසැල් දරුවන්ට සමුපකාර ව්‍යවසායික ක්‍රියාකාරකම් ප්‍රායෝගිකව පුහුණු කිරීම.

08. සමුපකාර ව්‍යාපාරය සඳහා තොරතුරු තාක්ෂණ ජාලයක් තොරතුරු නිශ්කාෂණ ක්‍රමයක් හඳුන්වාදීම.

09. සමුපකාර ව්‍යවසාය පිළිබඳ පර්යේෂණ හා වෙළඳපල සමීක්ෂණ සඳහා තොරතුරු ඒකරාශී කිරීම හා විග්‍රහ කිරීමේ ක්‍රමෝපායයන් ඇතිකිරීම.

## 04 කොටස

## ජාතික සමුපකාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

01. ජාතික සමුපකාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම රජය විසින් සමුපකාර විෂයභාර අමාත්‍යාංශ හරහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය, පළාත්සභා සමුපකාර අමාත්‍යංශ හා ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ඇතුළත් ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවනු ඇත. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් දරණු ඇත.

02. මෙම ක්‍රියාකාරී කමිටුව විසින් ජාතික සමුපකාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග හා සැලසුම් සකස් කරන අතර, පහත දැක්වෙන විෂය පථය විශේෂයෙන් අවධාරණය කරනු ඇත.

(අ) ජාතික සමුපකාර ප්‍රතිපත්තිය පිළිබඳව පුළුල් අවබෝධයක් අදාල ආයතනවලට ලබාදීම.

(ආ) සමුපකාර නීතිය සංශෝධනය කිරීම සමුපකාර තොරතුරු තාක්ෂණ ක්‍රමයක් සකස් කිරීම වැනි කාර්යයන් සඳහා විශේෂ කමිටු හා බලකාය පත්කර කටයුතු කිරීම.

(ඇ) සමුපකාර ව්‍යාපාර ස්වයං මූල්‍යයන් හා ස්වයං පාලනයෙන් යුතු ජනතා ව්‍යාපාරයක් කිරීමට අවශ්‍ය පරිවර්තන වැඩසටහනක් ජාතික ප්‍රතිපත්තියේ මග පෙන්වීම් ඇතුළත ක්‍රියාත්මක කිරීම.

(ඈ) මධ්‍යම රජය හා පළාත් සභා මට්ටමේ සමුපකාර සංවර්ධනය පිළිබඳව යොදාගන්නා යටිතල පහසුකම් ගැන අධ්‍යයනයක් කර අවශ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම් හා වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

(ඉ) ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව මධ්‍යම රජය හා පළාත් සභා අතර සම්බන්ධීකරණය කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

03. ජාතික සමුපකාර ප්‍රතිපත්තිය වර්ෂ තුනක් ඇතුළත ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.